උරුමය උල්පත් 16

අතිපූජ්‍ය ඊතලවැටුණු වැව ඥාණතිලක හිමිපාණෝ

***ප්‍රශ්නය : අවසරයි ස්වාමින් වහන්ස, මිරිසවැටිය දාගැබේ ඉතිහාසය පිළිබඳව යම් අදහසක් පළ කළොත්?***

පිළිතුර : ක්‍රි.පු. 161 හා 137 අතර කාලයේ දී දුටුගැමුණු රජතුමා අපේ රටේ රාජ්‍ය පාලනය කළා. දුටුගැමුණු රජතුමා ත්‍රීසිංහලේ එක්සත් කිරීම මියුගුණ වෙහෙරින් ආරම්භ කළ ගමන අවසානයේ යුද්ධය ජයගෙන ත්‍රිසිංහලේ එක්සත් කර නැවත මියුගුණ වෙහෙරටම පැමිණියා. රජතුමා මියුගුණ වෙහෙරින් ජයකුන්ධයට ධාතුන් වහන්සේ තැන්පත් කරගෙන පැමිණියා. ළමයෙකුට නම් තැබීමේදී වුනත් පොරොන්දුවක් ගැනීමේ සිරිතක් පැරැණි සිංහලයන් අතර තිබුණා. දුටුගැමුණු රජතුමාත් මේ ආකාරයෙන් පොරොන්දුවක් වෙලා සිටියා. භික්ෂූන් වහන්සේට අග්‍ර කොටස පිළිනොගන්වා වළඳන්නේ නැහැ යන්න එසේ වූ එක් පොරොන්දුවක්. ඒ නිසා රජතුමා භික්ෂූන් වහන්සේලාට හැමදාම දන් දුන්නා. එක් අවස්ථාවකදී අමතක වීමකින් රජතුමා මිරිස් ව්‍යංජනයක් ආර්යයන් වහන්සේට පූජා නොකොට වළඳා තිබුණා. ඒ පිළිබඳව රජතුමා බොහෝ දුක් වුණා. රජතුමා ජයකුන්ධය මෙම ස්ථානයේ තබා තිසා වැවට ගොස් ස්නානය කර පැමිණීමේදී ජයකුන්ධය වටා බුදුරැස් විහිදෙනවා දැක තිබෙනවා. මේ සිද්ධිය පිළිබඳව රජතුමා රහතන් වහන්සේලාගෙන් විමසා සිටියා. ''මෙය ශුද්ධ වූ භූමියක්. එවගේම දැන් ඔබතුමාගේ, ජාතියේ ප්‍රාර්ථනාව ඉෂ්ඨ වී අවසානයි. එම නිසා දැන් අවශ්‍ය යුද්ධය නොව ශාසනික මෙහෙවර ආරම්භ කිරීමයි. ඒ නිසා මෙම ස්ථානයේ ආගමික සිද්ධස්ථානයක් ආරම්භ කරන්න'' යනුවෙන් රහතන් වහන්සේලා රජතුමාට උපදෙස් දුන්නා.

අවුරුදු තුනයි මාස හයක් ඇතුළත රජතුමා මිරිසවැටිය චෛත්‍ය ඉදිකළා. මෙය වටේට පංචාවාස ආදි සියල්ලත් ගොඩ නැගුවා. ඉන්පසු රජතුමා මෙම චෛත්‍යට නමක් දැමීමට අදහස් කළා. මෙම ස්ථානයට එන සෑම දරුවෙක්ම භික්ෂූන් වහන්සේ, අම්මයි, තාත්තයි ඉදිරියේ යම් පොරොන්දුවක් වුවහොත් එය සුළු කොට සැලකිය නොහැකිය යන ධර්මතාවය දක්වා ආකාරයෙන් රජතුමා මෙයට

ඒ මිරිස් ව්‍යංජනයේ නම දැම්මා. අදත් අපි මරිසවට්ටිඨික, මිරිසවැටිය චෛත්‍ය යනුවෙන් මෙම චෛත්‍ය හඳුන්වනවා. පෙර කාලයේ මෙහි මරිචග්‍රාම යනුවෙන් ගමක් ද තිබී තිබෙනවා. මෙම මිරිසවැටිය චෛත්‍ය වසර 2100 ක් පමණ පැරැණියි. රජවරු තිස් දෙනෙකු පමණ මෙම චෛත්‍ය ප්‍රතිසංස්කරණය කර තිබෙනවා. වර්තමානයේ ද සැදැහැවතුන්ගේ ආධාර උපකාරයන්ගෙන් මෙය ප්‍රතිසංස්කරණය වෙමින් පවතිනවා.

***ප්‍රශ්නය : මෑතකදී තායිලන්ත රජය මගින් මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු වලට සහාය ලබා දුන්න නේද?***

පිළිතුර : තායිලන්තයේ රජතුමා මෙම චෛත්‍ය ප්‍රතිසංස්කරණය සඳහා ආධාර මුදල් ලබා දුන්නා. තායි රජතුමාගේ අභාවයෙන් පසුව එම ආධාර මුදල් දීම නැවතුණා. චෛත්‍ය සංවර්ධන සමිතියෙන් මෙම කටයුතු නැවත ආරම්භ කළා. ඉන්පසු චෛත්‍ය නැවතත් දෙදරා ගියා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ පිළිබඳව සොයා බලා නැවත තායිලන්ත රජයෙන් හා තවත් රට වලින් ආධාර උපකාර ගෙන ලංකා රජයේ හා ජනතාවගේ සහයෝගය ඇතිව මෙම චෛත්‍ය වර්තමාන ආකාරයෙන් නිර්මාණය කළා.

***ප්‍රශ්නය : අපේ රටට ජාතියට විශාල ඉතිහාසයක් තිබෙන බව අනුරාධපුරයට එන හැම අවස්ථාවකදීම මට හැඟී යනවා. නමුත් දැන් අපට සිදුවී ඇත්තේ කුමක්ද?***

පිළිතුර : අද නවීන ලෝකය දෙස බැලූවිට ඔවුන් නවීන බව කියමින් පරිහරණය කරන සියලුම දේ අපි ඉතිහාසයේ පරිහරණය කර තිබෙනවා. අද ඒ දේවල් අප සතුව නැහැ. ඒ නිසා ඒ දේවල් පිටරටින් ගෙනවිත් අපි පරිහරණය කරනවා. අද විදුලි පංකාව එදා ''රුන්පෙත්තා'' නමින් හැඳින්වුවා. එදා අපි විශාල මාලිගා හැදුවා. නොයෙකුත් ආකාරයේ ආභරණ භාවිතා කළා. හෝරායන්ත්‍ර (ඔරලෝසු) භාවිතා කළා. මේ ආකාරයෙන් අද තිබෙන හැම දෙයක්ම එදා අපි භාවිතා කළා. අද පුද්ගලයා නාගරීකරණය මගින් යාන්ත්‍රික වීම නිසා ඔහුට අද ආර්ථිකයේ පිහිට පැතීමට සිදුව තිබෙනවා. එදා අපි සතුව තිබූ ශ්‍රද්ධාව, භක්තිය,

ආධ්‍යාත්මික ගුණවන්තකම, යුතුකම් ආදි සියලු දේම ඒ නිසා අද අහිමි වී තිබෙනවා.

උදාහරණයක් ලෙස ගමක් ගත් විට එහි විශාල පිරිසක් හිටියා. ලොකු විශ්‍රෘත පවුලක් ජීවත් වුණා. නෑ හිතමිතුරන් අතරේ විශාල සම්බන්ධතාවයක් තිබුණා. අද නගරයට පැමිණි විට එසේ සම්බන්ධතාවයක් නැහැ. සම්බන්ධතාවය තිබෙන්නේ තමන්ගේ නිවසේ සිට පුද්ගලයන් අතර පමණයි. ඉතිහාසය සමග සසඳා බලන විට අද අපි මිශ්‍ර සංස්කෘතියකට යොමු වී සිටින බව පෙනීමට තිබෙනවා. අපේ ළමා කාලයේ රටේ වැඩිහිටි නිවාස තිබුණා ද කියා අපට මතක නැහැ. අම්මා, අප්පච්චි කියන නමට අපේ විශාල ගෞරවයක් තිබුණා. ඒ ගෞරවය අද නැතිවී තිබෙනවා. එදා පාසල් යන ළමයෙක් පාසල් ගියේ අම්මා තාත්තා දෙන්නාට වැඳලා. නිදා ගත්තේ වැඳලා. අවුරුද්දකට දහස් වාරයක් ඒ ආකාරයෙන් දෙමාපියන්ට වැද නමස්කාර කළා. බෞද්ධ ළමයෙක්ට අවුරුදු තිස්පහක් පිරෙන කොට අවම වශයෙන් විසිපන්දහස් වතාවක්වත් දෙමාපියන්ට වැඳ තිබෙනවා. ඒ නිසා ආදරයෙන්, ලැදියාවෙන් දෙමාපියන් ගෙන ආ දේ අහිමි කිරීමට දරුවා කැමති නැහැ. ඒ කාලයේ අපි ගෙදර සිටින විට තාත්තාගේ සරම ඇඳීමට පුරුදු වෙනවා. තාත්තාගේ පාවහන් පාවිච්චි කිරීමට විශාල කැමැත්තක් දැක්වූවා. තාත්තා ගියා අඩිපාරේ ඇති පාසටහන් වලට පා තබා ඇවිදීමට අපි පුරුදුව සිටියා.

නමුත් අද ආර්ථික සමග විශාල වශයෙන් පොර බැදීමට මිනිසුන්ට සිදුවී තිබෙනවා. අලුත් දේ කෙරෙහි මිනිසුන්ගේ හැඟීම් විශාල වශයෙන් ගමන් කරනවා. එක් වාහනයක් වැඩි කාලයක් පාවිච්චි කරන්නේ නැහැ. ඊළඟට අලුත් වාහනයක් ගන්නවා. නිවසක් නිර්මාණය කිරීමත් ඒ ආකාරයෙන් සිදු වෙනවා. ඇඳුම් වර්ග දහස් ගණනක් නිර්මාණය වෙනවා. විවිධ ආහාර වර්ග නිර්මාණය වෙනවා. මිනිසා මේ නව නිර්මාණයක් පිටුපස ගමන් කරනවා මිසක් තමන් සතුව තිබූ අධ්‍යාත්මික රටාවන් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීමට කාලය යොමු කරන්නේ නැහැ. නවීකරණය නිසා ඒවා ආරක්‍ෂා කර ගැනීමට හිත යොමු කරන්නනේ නැහැ.

*ප්‍රශ්නය : ගෝලීයකරණය වූ ලෝකයට අපේ අනන්‍යතාවය, සංස්කෘතිය, ධර්මය ආරක්ෂා කරගෙන ඇතුළු වන්නේ කෙසේද? යන්න අද අපිට තිබෙන ප්‍රශ්නයක්. ආර්ථිකය පිළිබඳ සිතීමට පෙර සමාජය ගොඩ නැගිය යුතුයි. සමාජය ගොඩ නැගීමට නම් අපි නිවැරදිව සිටිය යුතුයි. ඒ නිසා එය කරන්නේ කෙසේද?*

පිළිතුර : බඳුනේ ආකාරයට ජලය මිසක්, ජලය ආකාරයට බඳුන හදන්න අමාරුයි. ඒ නිසා අපේ සංස්කෘතිය, චර්යාවන්, හැසිරීම් හා සම්පත් පරිභෝජනය කර ගනිමින් ඉදිරියට යා යුතුයි. අපි කථා කරන භාෂාවේ බොහෝ ඉංග්‍රිසි වචන තිබෙනවා. අපි අඳින්නේ පිටරට ඇඳුම්. අපේ හැඟීම් ද ඒ ආකාරයෙන් වෙනස් වී තිබෙනවා. නමුත් ගැමි පරිසයේ බොහෝ පිරිසත් තවමත් ජීවත් වන්නේ පැරැණි ආකල්ප වල. ඒ නිසා අපි මෙහිදී ආකල්පමය වෙනසක් ද ඇති කළ යුතුයි. අනුරාධපුර හා උතුරුමැද පලාතේ වැව් තුන්සියයක් පමණ තිබෙනවා. මේ වැව්වලට වතුර පිරුණෝ නැතිනම් එතැනින් එහාට කරන දෙයක් ගැන ගොවියන් හිතලා නැහැ. වට්ටක්කා වගා කරන කාලයට වට්ටක්කා. බඩඉරිඟු කාලයට බඩ ඉරිඟු තිබෙනවා. අනෙක් කාලයට පිටරටින් ගෙන්වනවා. ඒ මිනිසුන්ගේ ආර්ථිකමය, සංස්කෘතිකමය ආකල්ප වෙනසක් ඇති වීමේ වේගය අඩුයි. අපේ බොහෝ තරුණ ළමයි විදේශ රටවල රැකියාවන් කරනවා. ඔවුන් එන විට ඒ රටවල සංස්කෘතීන් ගමට ගෙන එනවා. යුද හමුදාවේ ළමයින්ගේ අතට මුදල් ලැබෙනවා. ඒ මුදල් වලින් ඔවුන් ඉගෙන ගත් නොයෙක් සංස්කෘතීන් ගෙන එනවා. නගරයත් සමඟ කිට්ටු සම්බන්ධකම් තිබෙනවා. නවීණ තාක්ෂණයට අනුකූල බොහෝ උපකරණ පරිහරණය කරනවා. ඒ නිසා සංස්කෘතිමය වශයෙන් ආකල්පය වෙනසක් ඇති වන්නේ නැහැ. කෘෂිකර්මය මුල්කර ගත් තුන්වැනි ලෝකයේ රටක් වශයෙන් ඒ කෘෂිකාර්මික නිෂ්පාදනය මිනිසුන්ගේ අත්‍යාවශ්‍යතාවය අනුව සිදු කිරීම වැදගත්.

*ප්‍රශ්නය : අපේ ඉතිහාසය දෙස බලන විට මිරිසවැටිය වැනි දාගැබක් නිර්මාණය කිරීමේදී විශාල ආත්මශක්තියක්, ආත්ම විශ්වාසයක් තිබුණා. ඒ වගේම හොඳ නායකත්වය ද තිබුණා. කෘෂිකර්මය අතින් ද ඒ ආකාරයේ දියුණුවක් තිබුණා. අපේ ඉතිහාසය යා යුතු ආකාරයට ගියා නම් අපේ රට අද මෙ තත්ත්වයෙන් තිබෙන්නේ නැහැ. ඒ නිසා අපට වැරුදුනේ කොතැනද?*

පිළිතුර : ගින්දරට පූජා පැවැත් වූ මිනිසුන් පහන් පූජාවට පුරුදු වුණා. පර්වත වැඳපු මිනිසුන් චෛත්‍ය, දාගැබ් වදින්න පටන් ගත්තා. මහා රූක්ෂ ගස් වලට වැඳපු මිනිසුන් බෝධීන් වහන්සේ වඳින්න පටන් ගත්තා. දේවානම්පියතිස්ස රජතුමා බුදු දහම වැළඳ ගත් විට රටේ සියලු දෙනාම බුදු දහම වැළඳ ගත්තා. රටක් පාලනය කරන ප්‍රධානීන් ආදර්ශවත් වී, දීර්ඝ කාලීන සැලසුම් සමඟ ගමන් කරනවානම් එය එතරම් අපහසු වන්නේ නැහැ.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ බටහිර බොහෝ රටට වලට වැඩම කොට ධර්ම දේශනා පවත්වා තිබෙනවා. අද බටහිර ලෝකයේ ධර්මය පිළිබඳ විශාල පිබිදීමක් තිබෙනවා. ඒ හරහා අපට තිබෙන අවස්ථාව කුමක්ද?***

පිළිතුර : අපේ මිනිසුන්ට තිබෙන්නේ ආගමික පැත්ත පිළිබඳ ශ්‍රද්ධාවක්. නමුත් බටහිර ලෝකයේ මිනිසුන් බොහෝ විට අවධානය යොමු කරන්නේ දර්ශනය, භාවනාව පැත්ත පිළිබඳව. දැන් ඔවුන් භාවනාව හා දර්ශනය පිළිබඳ බොහෝ දේ ඉගෙන ගන්නවා. එවිට ඔවුන් ධර්මය භාවිතා කරනවා. අපි ශ්‍රද්ධාව, භක්තිය, ශීලවන්ත කම ආදි ආගමික පැත්ත භාවිතා කරනවා. වෙනත් ආගම් වලට වඩා දර්ශනය, භාවනාව ආදියෙන් බුදු දහම විශාල වශයෙන් ඉදිරියෙන් සිටිනවා. ඒ නිසා බටහිර ලෝකය එයට ප්‍රිය කරනවා. බටහිර ලෝකයේ ධර්ම දේශනා පවත්වන විට ඔවුන් අසන ප්‍රශ්න වලින් ඒ බව පැහැදිලි වෙනවා. සෑම ප්‍රශ්නයක්ම අහන්නේ දර්ශනය සම්බන්ධව. අපේ ගමක බණ දේශනා කරන විට අහන්නේ ආගමික පැත්ත සම්බන්ධ ප්‍රශ්න. අපෙන් ප්‍රශ්න කරන පුද්ගලයා බොහෝ පොත් පත් පරිහණය කොට බොහෝ දේ ඉගෙන ගෙන, අධ්‍යයනය කර තේරුම් ගත නොහැකි දෙයක් අපෙන් අසනවා.

තායිලන්තය අපේ රට ආසන්නයේ තිබෙන බෞද්ධ රටක්. තායිලන්තයෙන් අපට බොහෝ උදව් ලබා ගත හැකියි. අපේ අනුරාධපුර නගරය රටේ විශාලම ආදායම් ලබන ආර්ථික නගරය බවට පත් කළ හැකිය. ඉන්දියාවට අපේ රටේ සිට මොන තරම් විශාල ජනගහණයක් වන්දනාවේ යනවාද? ඉන්දියාවේ ආර්ථිකයට විශාල ආදායම් ලැබෙනවා. එදා ආගමික සිද්ධස්ථාන දියුණු කිරීම

සඳහා විශාල මුදලක් වෙන් කළ විට රටේ අනෙක් අය විරුද්ධ වුණා. නමුත් ඔවුන්ගේ රජය එය කළා. මෙය තවත් අවුරුදු තුනකින් ප්‍රතිඵලදායක බව ඔවුන් දැන සිටියා. අවුරුදු දෙකකින් සිද්ධස්ථාන දියුණු කර වන්දනාව සඳහා සුදානම් කළා විට ඔවුන්ගේ ආර්ථිකයේ සියලු දේ හරි ගියා. පසුගිය දින වල ශ්‍රී මහා බෝධීන් වහන්සේ බැලීමට ලක්‍ෂ ගණනක් ජනතාව පැමිණියා. නමුත් විදේශිකයන් මේවා දැක නැහැ. ඔවුන් මේවා දුටුවිට පුදුමයට පත් වෙනවා. අනෙකුත් ආගම් සමග බලන විට මේවා ඉතිහාසයේ ඇති පැරැණිතම නිර්මාණ. ඒ නිසා මේ දුටු විට ඔවුන් පුදුමයට පත් වෙනවා. ඒ නිසා මේ සංස්කෘතිමය, ශාස්ත්‍රීය ආදි පැති වලින්, මාධ්‍ය තුළින් ලෝකයාට ලබා දිය යුතුයි. මෙවැනි සිද්ධස්ථාන, ආගමික මධ්‍යස්ථාන, දර්ශන ඔවුනට පෙන්විය යුතුයි. එසේ විදේශිකයන්ගේ පැමිණීම වැඩි වන විට රටේ සෑම අංශයකම සුබදායි දේවල් සිදු වෙනවා. ඒ නිසා අටමස්ථානය පමණක් දියුණු කර ලෝක පූජිත කළොත් රටේ විශාල ආර්ථික බලපෑමක් ඇති කිරීමට හැකි වෙනවා.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ තරුණ සමාජය පිළිබඳව උනන්දුවක් දක්වනවා. අපේ තරුණ සමාජය තුළත් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයි. එය පවුල් හා අධ්‍යාපන පසුබිම තුළින් සිදු කළ යුතුයි. අපේ අධ්‍යාපනය පිළිබඳව බැලූ විට කළ යුතු වෙනස්කම් මොනවාද?***

පිළිතුර : ලංකාවේ ලක්‍ෂ ගණනක් උසස් පෙළ විභාගයට පෙනී සිටිනවා. නමුත් මෙයින් විශ්ව විද්‍යාලයට යන්නට හැකි වන්නේ දසදහසක්, දොළොස් දහසක් වැනි ප්‍රමාණයකට පමණයි. අසමත් වූ අය ''මම කරන්නේ කුමක්ද?'' කියා ප්‍රශ්නාර්ථයක නවතිනවා. එසේ අසමත් වන අයට අනාගතය ගොඩ නගා ගැනීමට යම් ව්‍යාපෘතියක් ඇති කළ යුතුයි. එවිට ඔවුන් ඒ මාර්ගයෙන් ස්වකීය අනාගතය ගොඩ නගා ගන්නවා. ඔවුන්ගේ උනන්දුව ද වැඩි වෙනවා. විශ්ව විද්‍යාල වලට ගොස් උපාධිය ලබා ගත් පසු සිදු වන්නේ මෙයයි. උපාධිය ගෙන යම් වෘත්තියකට ගිය පසු වෘත්තීය සුදුසුකම පිළිබඳව විමසනවා. එහිදී උපාධිය වෘත්තීය සුදුසුකමක් වන්නේ නැහැ.

*ප්‍රශ්නය : අපේ සමාජය තුළ පවුලේ ඇති වටිනාකම පවා අද බිඳ වැටිලා. එයින් සමාජය පවා විනාශ විය හැකියි. ඒ නිසා එය ආරක්‍ෂා කර ගන්නේ කෙසේද?*

පිළිතුර : ඉස්සර කාලයේ අපේ අප්පච්චි, අපේ අම්මා යන වචන සඳහන් කරන විට ලොකු පෞරුෂයක් තිබුණා. තාත්තා වැඩ නිම වී නිවසට එන විට සියලු දෙනාම නැගිටිනවා. නමුත් අද දරුවා සහ පියා සියලු දේ කරන්නේ එකට. අම්මා තාත්තා දෙන්නාගේ සියලු හැසිරීම්, කථා බහ දරුවා අවබෝධ කර ගන්නවා. අද තිබෙන්නේ න්‍යෂ්ටික පවුලක්. බොහෝ දුරට අද පවුලක ඉන්නේ ළමයෙක් හෝ දෙන්නෙක් පමණයි. තාත්තා සහ අම්මා දෙන්නාම වෘත්තීන්ට යනවා. දරුවන් හැදෙන්නේ වැඩකරන උදවිගේ ආශ්‍රයෙන්. දරුවන් පාසලට යනවා. පාසලෙන් පසුව පෞද්ගලික අධ්‍යාපන ආයතන වලට යනවා. ගෙදර එන්නේ බොහෝ රෑ බෝ වෙලා. දෙමාපියන් සමඟ ආශ්‍රයක් නැහැ. එවිට දෙමාපියන් පිළිබඳ තිබෙන හැඟීම් අඩු වෙනවා. විවාහ ජීවිතයත් පවතින්නේ ඒ ආකාරයෙන්. ඉස්සර කාලයේ විවාහය තුළ බැඳීමක් තිබුණා. නමුත් අද විවාහ වීමේදී කිසිඳු හැඟීමක් නැහැ. විවාහ වන තැනැත්තියේ පියා විසින් විවාහ වන පුද්ගලයා පිළිබඳව හොඳින් පරීක්‍ෂා කළා. හොඳින් සොයා බැලුවා. බෑණාට තම දියණිය ලබා දීමට තීරණය කරන්නේ ඉන් අනතුරුවයි. නමුත් අද එසේ නැහැ. දරුවන්ගේ කැමැත්ත අනුව, දරුවන් අතරම අද එය සිදු වෙනවා. පාසල් අධ්‍යාපනයේදී තමන්ගේ අනාගතය ජීවිතය පිළිබඳව තීරණය ගන්නවා. එදා එම තීරණය ගත්තේ නෑදෑයෝ, දෙමාපියන් එකතු වෙලා. අද ළමයින්ට අවවාද කරන්න බැරි තත්ත්වයක් උදාවෙලා. ඒ නිසා බොහෝ අය තමන්ගේ තරුණ ජීවිතය පමණක් රැක ගන්න උත්සාහ කරනවා. විවාහ ජීවිතය රැක ගන්න උත්සාහ කරන්නේ නැහැ. බටහිර සංස්කෘතිය, හැඟීම් සමඟ තරුණයන්ගේ ආකල්ප, හැඟීම් වෙනස් වෙලා තිබෙනවා. අද සියලු දෙනාම අලුත් දේ පසුපස යනවා. අපිට ආපස්සට එන්න බැහැ. ඒ නිසා අපේ ගුණධර්ම, සංස්කෘතිය රැක ගනිමින් අද යුගයට උචිත ආකාරයෙන් සියලු දේ කළ යුතුයි.

*ප්‍රශ්නය : එය කළ යුත්තේ කෙසේද?*

පිළිතුර : අපේ මුල් අවස්ථාව ගෙදර සහ පාසල. ඒ නිසා ළමයා හදා ගැනීමේ වගකීම ගුරුවරුන්ට වගේම දෙමාපියන්ටත් පැවරෙනවා. මනුෂ්‍යා නොහදා විශ්වයේ වෙන කිසිම දෙයක් නිර්මාණය නොහැකියි. විශ්වයේ ඇති සියලු දේ නිර්මාණයන් කර තිබෙන්නේ මනසින්. මිනිසා සත්වයින්ගෙන් වෙනස් වන්නේ උසස් මනසක් තිබෙන නිසයි. ඒ බව බුදුරජාණන් වහන්සේ ද දේශනා කර තිබෙනවා. ඒ නිසා අපි මනසෙන් උසස් විය යුතුයි. එසේ උසස් වීමට නම් ඒ පවුල නැමති මුල් බීජයේ සිට හැඩ ගැසිය යුතුයි.

*ප්‍රශ්නය : අපේ ඊළඟ තැන පන්සලයි. පන්සල මේ අභියෝගයට මුහුණ දෙන්නේ කෙසේද?*

පිළිතුර : අපේ පන්සලේ නායක ස්වාමින් වහන්සේ වැඩ සිටියා. පන්සලට එන යන අය පන්සල සමඟ සම්බන්ධතා පැවැත්වූවා. ළමයාට අකුරු කියවන්නේ, වැඩිවියට පත් පසු අවශ්‍ය නැකැත් සදා ගන්නේ පන්සලේ හාමුදුරුවන්ගෙන්. ජීවිතයට අවශ්‍ය උපදෙස් ලබා ගන්නේ ස්වාමින්වහන්සේගෙන්. එදා පාසල පවත්වාගෙන ගියේ පන්සල තුළයි. කාලය සමඟ මේ මධ්‍යස්ථාන වෙනස් වුණා. පන්සල සමඟ තිබූ සම්බන්ධතාවය ඈත් වුණා. පන්සලේ හාමුදුරුවෝ ආගමික වැඩ සඳහා පමණක් අවශ්‍ය වුණා. ඉස්සර 'අපේ හාමුදුරුවෝ' යනුවෙන් ආමණ්ත්‍රනය කළා. අපි 'අපේ මහත්තයා' යනුවෙන් කථා කළා. එදා අපේ කියන හැඟීම තිබුණා. නමුත් අද එය වෙනස් වෙලා. ඒ නිසා අද බොහෝ පිරිස් තනි වෙලා.

*ප්‍රශ්නය : අපි ඒ අභියෝගයට මුහුණ දෙන්නේ කෙසේද?*

පිළිතුර : ගම, පන්සල සමඟ තිබෙන සම්බන්ධය වැඩි කළ යුතුයි. ගමේ කටයුතු පන්සලේ ස්වාමින්වහන්සේ හරහා සිදු කළ විට නිතර නිතර ස්වාමින්වහන්සේ ආශ්‍රය කිරීමට අවස්ථාව ලැබෙනවා. චරිත සහතිකයක් පවා ගන්නේ පන්සලේ හාමුදුරුවන්ගෙන්. පන්සලට නොගියපු අයට පවා ස්වාමින්වහන්සේ එය ලබා දෙනවා. ස්වාමින් වහන්සේ දායක පවුල් වල සියලු දෙනාගේම විස්තර දන්නවා.

ළමයින් කුඩා කළ සිටම පන්සලට ළං වීමේ ප්‍රවණතාවය වැඩි කළ යුතුයි. එසේ කළහොත් විනාශ වී යන දේ රැක ගත හැකියි.

***ප්‍රශ්නය : නවීන යුගයේ ඇති අභියෝග වල මුහුණ දීමේ වැඩ පිළිවෙලක් පිරිවෙන් අධ්‍යාපනය තුළ තිබෙනවාද?***

පිළිතුර : ගමේ පිරිවෙනේ බොහෝ අඩුපාඩුකම් තිබෙනවා. ඒ නිසා ගමේ පොඩි හාමුදුරුවෝ නගරයට ගොස් සියලු දේ ඉගෙන ගන්නවා. ඉන්පසු උන්වහන්සේ ගමට එන්න මැලි කමක් දක්වනවා. ඒ නිසා ගමට සියලු පහසුකම් ලබා දිය යුතුයි. අපේ කාලයේ බොහෝ පිරිසක් පිරිවෙන් අධ්‍යාපනය ලැබුවා. අද පිරිවෙනට ඇතුලත් වන්නේ කිසිවක් කර ගත නොහැකි සාමාන්‍ය සමාජයේ ළමයින් පමණයි. වියතුන් බොහෝ උගතුන්, දාර්ශනිකයන් පිරිවෙන් අධ්‍යාපනය ලැබූ අය. පාලි, සංස්කෘත, සිංහල යන මේ හැම භාෂාවකම මූල බීජ පිරිවෙනයි. පිරිවෙනේ යම් වැඩපිළිවෙලක් තිබෙනවා. පාසල් අධ්‍යාපනයට වඩා පිරිවෙන් අධ්‍යාපනය අමාරු විෂයයක්. එහි භාෂාවන් වැඩියි. පන්සල් වල සිටින ස්වාමින් වහන්සේලා බොහෝ උගත් අය. බොහෝ ස්වාමින් වහන්සේලාට ශාස්ත්‍රපති උපාධි, දර්ශනපති උපාධි තිබෙනවා. එයට හේතුව පිරිවෙන් අධ්‍යාපනයේ තිබෙන ශක්ති සම්පන්ප භාවයයි. ගමේ පිරිවෙනට රාජ්‍ය සහ පෞද්ගලික අනුග්‍රහය ලැබෙනවා නම් එය ඉතාම වැදගත් වෙනවා.

***ප්‍රශ්නය : ගිහි සමාජය පැත්තෙන් බැලු විට මේ අභියෝගයට සාර්ථකව මුහුණදීම සඳහා යුතුකම් රැසක් ඉටු කළ යුතුයි. ඒ යුතුකම් මොනවාද?***

පිළිතුර : පිරිවෙන පවත්වන්නේ ධර්මශාලාව තුළයි. පිරිවෙන පවත්වන්න වෙනම ගොඩනැගිල්ලක් නැහැ. පාසල් වල විවිධ දක්ෂතා ඇති ගුරුවරු සිටිනවා. ඒ ගුරුවරයා හරහා ඒ දක්ෂතාවය දියුණු කර ගත හැකි වෙනවා. නමුත් පිරිවෙන් අධ්‍යාපනයේ සිටින්නේ ගුරුවරු සුළු පිරිසක්. සියලු දෙනාම උගන්වන්නේ, අවවාද අනුශාසනා කරන්නේ පිරිවෙන තුළ සිටින මේ සීමිත ගුරුවරු. ඒ නිසා ක්‍රියාත්මක වන්නේ එකම වැඩපිළිවෙලක් පමණයි. පරිඝණක තාක්ෂණය පිරිවෙනට යා යුතුයි. එවිට ස්වාමින්වහන්සේට ලෝකය පිළිබඳ අවබෝධයක්

ලබා ගත හැකි වෙනවා. එවගේම ස්වාමින් වහන්සේලාට ප්‍රත්‍ය පහසුකම් වල අඩුපාඩු තිබෙනවා. එම නිසා පිරිවෙන් සඳහා රාජ්‍ය, පෞද්ගලික අනුග්‍රහයන් වගේ එම ආයතන දියුණු කොට අවශ්‍ය දේ ලබා දුනහොත් එය වැදගත්.

***ප්‍රශ්නය : ඔබ වහන්සේගේ දර්ශනය අනුව බලන විට දායක සභාව ඉතා වැදගත් ආයතනයක්.***

පිළිතුර : ගමක දායක සභාවක් යනු එදිනෙදා ජීවිතය ගත කරන මිනිසුන්ගෙන් සැදුම් ලත් සභාවක්. දායක සභාවකින් ශ්‍රමදාන වැනි පොදු කටයුතු කරනවා මිසක් ආයතනයක් දියුණු කිරීමට ආර්ථික ශක්තිය අඩුයි. එදා දායක සභාවක පන්සලේ ස්වාමින් වහන්සේ, ගමේ වෙද මහත්තයා, පාසලේ විදුහල්පතිතුමා සිටියා. ගමක් පාලනය කළේ මොවුන් තිදෙනායි. අද ඒ තුන්දනාගේ බලය වෙන උදවිය අරගෙන. ඒ නිසා දායක සභාවේ බලය හීන මට්ටමකට පත් වෙලා තිබෙනවා. දායක සභාවේ බලයට වඩා ස්වාමින් වහන්සේගේ බලය වැඩි නම් තනි තීරණ ගෙන ඒ පන්සල දියුණු කරන්න ස්වාමින් වහන්සේට අවස්ථාව තිබෙනවා. ඒ නිසා ගමක දායක සභාවෙන් ලබා දිය හැක්කේ ශ්‍රමය හා ශක්තියයි.

***ප්‍රශ්නය : ඉදිරියේදී එය දියුණු කරන්න රජයට වගකීමක් තිබෙනවාද? නැතිනම් සමාජයේ දානපතියන් එකතු වී එය කළ යුතුද?***

පිළිතුර : රජයකින් කළ යුත්තේ පන්සලක භෞතික පැත්ත දියුණු කිරීම. දායක සභාවකින් අධ්‍යාත්මික පැත්ත දියුණු කළ යුතුයි. භෞතික සම්පත් ඒකරාශී වී ඒ ආයතනය දියුණු වෙනවා නම් එම දායකයන්ගේ අධ්‍යාත්මය දියුණු කිරීම ස්වාමින් වහන්සේගේ වගකීමයි. පෞද්ගලික පන්ති පන්සලේ පැවැත්වුවහොත් එහි සංවරභාවයක් තිබෙනවා. පන්සලේ ඒ හැදියාව තිබෙනවා. ඒවාට පැමිණෙන්ගේ ගමේ දායකයන්ගේ දරුවෝ. එවිට ගමේ දායක මහත්වරු උනන්දුවෙන් පන්සලේ කටයුතු සඳහා යොමු වෙනවා. අද වැඩිම කාලයක් ගමනාගමනය සඳහා යොමු වෙනවා. දවසට පැය අටක් නිදා ගත් විට අවුරුද්දකට පැය තුන්දහසක් නිදා ගෙන තිබෙනවා. දවසට පැය අටක් රැකියාව

කළ විට අවුරුද්දකට පැය තුන්දහසක් රැකියාව කොට තිබෙනවා. අනෙකුත් කටයුතු සඳහා ද පැය දහසක් පමණ වැය වෙනවා. ඒ නිසා බොහෝ දෙනා කාලය ගත කොට තිබෙන්නේ ගමනාගමනය සඳහායි. ගමේ තිබෙන ශක්තිය, ජවය, බලය අගය කොට තව තවත් මෙයට ශක්තියක්, ජවයක් දෙනවානම් මහා වෘක්ෂයක් බවට පත් වෙලා මේ අරමුණ ජය ගන්න හැකියාව තිබෙනවා.

***ප්‍රශ්නය : අපේ පාලකයන්ට, සමාජ නායකයන්ට දෙන්න ඔබ වහන්සේට යම් එක් උපදෙසක් තිබෙනවානම් එය කුමක්ද?***

පිළිතුර : මේ දේශය පාලනය කරනවානම් ද්වේශය පාලනය කොට දේශපාලනය කළ යුතුයි. රටේ ප්‍රධානියා, අහසේ සිටින පක්ෂියාගේ සිට ජලයේ සිටින මත්ස්‍යයා දක්වා ප්‍රධානියයි. ඒ තනතුරට පත් වු පසු ඔහුට පක්ෂයක්, පන්තියක් නැහැ. ඔහු සියලු දෙනාගේම ප්‍රධානියයි. ඒ නිසා රට පාලනය කරන විට ද්වේශය, ඉරිසියාව, පළිගැනීම ආදියෙන් තොරව ''මම සත් භාවයෙන්, මෛත්‍රියෙන් රට පාලනය කරමි'' යන අධ්‍යාත්මය තුළ සිට රටක් පාලනය කරන විට, අනෙකුත් ප්‍රාදේශීය, ග්‍රාමීය නායකයෝ යන සියල්ලෝම යහපත් වෙනවා. කළ යුතු දේ නොව, කළ හැකි දේ කියන පාලකයන් අවශ්‍ය වෙනවා.

***බොහෝ ස්තූතියි, ස්වාමින්වහන්ස.***